බස්නාහිර පළාතේ පළාත් සභාව
மேல் மாகாண மாகாண சபை
Western Province Provincial Council

බස්නාහිර පළාතේ පළාත් සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන් වෙත,

**සභා රැස්වීම**

2015 මාර්තු මස 17 වන දින කල්තැබීම අනුව, බස්නාහිර පළාතේ පළාත් සභාව 2015 අප්‍රේල් මස 07 වන දින පෙ.ව. 9.30 ට බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ පළාත් සභා ගොඩනැගිලි පරිශ්‍රයේ සභා ශාලාවේදී රැස්වෙන බව කාරුණිකව දැනුම් දෙමි.

න්‍යාය පත්‍රය මේ සමඟ ඇත.

සුනිල් විජේරත්න,
සභාපති,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.03.18 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2015 අප්‍රේල් මස 07 දින පෙ.ව.9.30ට

# න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

01. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නිතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළද විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015.02.18 දින අසන ලද ප්‍රශ්ණය:

(ප්‍ර/VI (1) /15/01)

අ) බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාසල් වල 2015 වසර සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කරගනු ලැබුවේද?

ආ) එම ඇතුලත් කිරීම්වලට අනුව පාසලක හඳුනාගැනිම සඳහා යොදා ඇති පන්තිවල නම් සහිතව එක් එක් පන්තියේ සිටින ළමුන් ගණන හා ඒ ඒ පන්තියේ සම්පූර්ණ කළ හැකි ඉතිරි පුරප්පාඩු ගණන කොපමණදා

ඇ) පුරප්පාඩු සඳහා ක්‍රියාන්විත රාජකාරියේ සිටින පවුල්වල ළමුන් ලෙස අයදුම් කොට අනුමත කර එවා ඇති ළමුන් ගණන ඒ ඒ පාසලට අනුව කීයද?

ඈ) ඒ අනුව ඒ ඒ පන්තිවලට ඇතුලත් කිරීමට හැකියාව ඇති පුරප්පාඩු ගණන කියද?

ඉ) මෙම පුරප්පාඩු පිරවීම සඳහා ගන්නා ක්‍රියාමාර්ගය කවරේද?

ඊ) නොඑසේ නම් ඒ මන්ද?

02. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් 2015.02.18 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /15/02)

අ) බස්නාහිර පළාතේ ඒ ඒ කලාප කාර්යාල වලට අනුව 6,7,8,9,10 හා 11 ශ්‍රේණිවල ලිවීම හා කියවීමට නොහැකි ශිෂ්‍යයින් පිළිබඳව වාර්තාවක් ලබා දෙන්නේද?

ආ) වාර්තාවට අනුව ලිවීමට හා කියවීමට නොහැකි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීයද?

ඇ) මෙම ශ්‍රේණි පරාසයන්හි පසුගිය වසර 5 තුළ පාසල් එම අතරමග නැවතුන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද?

ඈ) ඒ කුමන පාසල් වලද? කුමන ශ්‍රේණිවලද?

03. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදිකිරීම්, ජලසම්පාදන හා ජලාපවහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමාගෙන් 2015.03.17 දින අසන ලද ප්‍රශ්නය:

(ප්‍ර/VI (1) /15/07)

අ) ගරු නිමල් ලාන්සා අමාත්‍යතුමා V වන පළාත් සභා කාලය තුළ දරන ලද විෂයයන් භාර අමාත්‍යවරයා වශයෙන් තම ධුරයේ කටයුතු සඳහා විදේශ ගත වූ අවස්ථා ගණන කීයද?

ආ) විදේශ ගත වූ රට , කුමන දිනවලද? ඒ අනුව විදේශ ගතව සිටි දින ගණන කවරේද?

ඇ) එකී දිනයන්හි සහභාගී වූ වැඩ සටහන් කවරේද?

ඈ) අමාත්‍යවරයා සමග විදේශ සංචාර වෙනුවෙන් සහභාගීවූ අනෙකුත් අය කවුරුන්ද?

ඉ) ඒ ඒ සංචාර සඳහා වැයකළ මුදල කොපමණද?

ඊ) සංචාරයන් සඳහා වැයකළ මුළු මුදල කොපමණද?

උ) ඒ ඒ සංචාර මගින් පළාත් සභාව වෙත ලැබුණු ප්‍රතිලාභ කවරේද?

ඌ) නොඑසේ නම් ඒ මන්ද?

**04.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/09)

අ. කැළණිය අධ්‍යාපන කලාපයේ හේනේගම මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ විෂමාචාරයන් පිළිබඳ විගණන පරීක්ෂණයක් සිදුකර ඇති බව ඔබතුමා දන්නවාද?

ආ. එම විගණන පරීක්ෂණය අනුව, විදුහල්පතිවරයා විසින් විෂමාචාරයක් සිදුකර ඇති බවට කරුණු අනාවරණය වී ඇති බව, ඔබතුමා දන්නවාද?

ඇ. ඔබතුමා හා ඔබ අමාත්‍යාංශය මගින් ඒ සම්බන්ධව ගත් ක්‍රියාමාර්ග මොනවාද?

ඈ. මෙම විදුහල්පතිවරයාට විෂමචාර චෝදනා තිබියදී, දිගින් දිගටම මෙම පාසලේ විදුහල්පති තනතුරේ රඳවා සිටීම විනය පටිපාටියට පටහැනි බව, ඔබතුමා නොදන්නේද?

ඉ. මෙම විදුහල්පතිවරයා පාසල තුළ සිදුකළ විෂමාචාරයන්ට අදාළව සිදුකළ විගණන පරීක්ෂණයද, ඉදිරිපත් කරමින් අල්ලස් හා දූෂණ වංචා කොමිෂන් සභාවට පැමිණිල්ලක් ඉදිරිපත් වී ඇති බව, ඔබතුමා දන්නේද?

ඊ. එසේනම් ඒ සම්බන්ධව ඔබතුමා විසින් ගත් ක්‍රියාමාර්ග කවරේද?

උ. ඉහත කී විගණන පරීක්ෂණය සිදුකර සැලකිය යුතු කාලයක් ගතව තිබියදීත්, මෙම විදුහල්පතිවරයා සම්බන්ධව විධිමත් විනය ක්‍රියාමාර්ග නොගැනීමට හේතු මොනවාදැයි මෙම සභාවට ඉදිරිපත් කරන්නේද?

**05.** ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු ආහාර සැපයීම හා බෙදාහැරීම, සමුපකාර සංවර්ධන ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/10)

අ. මීගමුව සිට මුතුවාඩිය දක්වා මාර්ගයේ ගමන් ගන්නා මගීන්ට දීර්ඝ කාලයක සිට බස් රථයක් නොමැති බව ඔබතුමා දන්නේද?

ආ. මේ නිසා විශේෂයෙන්ම උදෑසන රාජකාරී සඳහා ගමන් ගැනීමේදීත්, දරුවන්ට පාසැලට යාම සඳහාත්, සවස නැවත නිවෙස් බලා යාමේදීත්, ඔවුන් දැඩි පීඩාවට පත්ව ඇතිබව ඔබතුමා දන්නෙහිද?

ඇ. ඒ සඳහා ඔබතුමා යම් පියවරක් ගෙන තිබේද?

ඈ. නොඑසේ නම් ඒ මන්ද?

ඉ. මෙම ප්‍රදේශයේ ජනතාවගේ පොදු ගමන් අවශ්‍යතාව ඉටුකිරීම සඳහා අදාළ ආයතන සම්බන්ධ කරගෙන ඔබතුමා යම් පියවරක් ගන්නේද?

**06.** ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /15/11)

කළුතර දිස්ත්‍රික්කයේ ඇති පාසැල් අතරින්,

අ. පාසැලේ සුබසාධන කටයුතු සඳහා 2015 මාර්තු 01 වන විට බස්රථ හිමිව ඇති පාසැල් මොනවාද?

ආ. ඒවා පාසලට ලැබී ඇත්තේ කවදාද?

ඇ. එම බස්රථ වර්ගය සහ ඒවායේ අංක මොනවාද?

ඈ. එම බස්රථ පාසලට ලැබුනේ රජයෙන්ද? ආදි ශිෂ්‍ය සංගම් අරමුදලෙන්ද, නැත්නම් පෞද්ගලික ධන පරිත්‍යාගයෙන්ද? යන්න වෙන් වෙන්ව දක්වන්නේද?

ඉ. පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් නම් එම පරිත්‍යාගශීලීන් කවුද? යන්න පාසැල්වලට අදාලව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද?

ඊ. එම බස් රථ අතරින් කවර ඒවා ධාවන තත්වයේ පවතීද?

**07.** ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමාගෙන් ඇසීමට;

(ප්‍ර/VI (1) /15/12)

අ. කළුතර හා මතුගම අධ්‍යාපන කලාපවල පාසැල්වල පළමු වසර සිසුන් සඳහා පාසැල් බෑග් සහ උපකරණ බෙදාදීමේ ව්‍යාපාතියක් 2015 පෙබරවාරි සහ මාර්තු මාසවල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පැවැත්වීද?

ආ. නොඑසේනම් එම කාලය තුල එවැනි උත්සව පාසැල්තුල හෝ පාසැල් වලින් පිට පැවැත්වූ බව ඔබතුමා දන්නේද?

ඇ. නිල ඇඳුමින් පාසැල් වේලාව තුල දරුවන් එම උත්සව සඳහා පාසැල්වලින් පිටතට යැවීමට ඒ ඒ පාසැල්වල විදුහල්පතිවරුන්ට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් අවසර ලබාදී තිබේද?

ඈ. එසේ අවසරයක් නැතිව දරුවන් එම උත්සවවලට සහභාගි කරවූයේ නම් අදාල විදුහල්පතිවරුන් වරදක් කර තිබේද?

ඉ. එවැනි වරදක් කර තිබේ නම් ඒ සඳහා ගනුලබන ක්‍රියාමාර්ග කවරේද?

08. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා, සහ සභා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට:

(ප්‍ර/VI (1) /15/13)

ඇ. රෝහල්වල බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබාගැනීමට පැමිණෙන රෝගීන් සඳහා නැවතීම් කාමර (waiting room)ඉදිකිරීමේ ව්‍යාපෘතියක් පළාත් සෞඛ්‍ය අමාත්‍යංශයෙන් ක්‍රියාත්මක කරන්නේද?

ආ. ඒ සඳහා තෝරාගත් රෝහල් මොනවාද?

ඇ. එක් එක් නැවතීමේ කාමරයක වර්ග අඩි ප්‍රමාණය කොපමණද?

ඇ. එක් එක් ඉදිකිරීම සඳහා වැයකරන ලද මුදල වෙන් වෙන්ව කොපමණද?

## VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

## VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

## VIII. පෞද්ගලික පැහැදිලි කිරීම

## IX. පොදු කටයුතු

01. ගරු ප්‍රසන්න රණතුංග - ගරු ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකිරක්ෂා ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති හා වෙළඳ විෂය භාර අමාත්‍යතුමා (බ.ප), විසින් ඉදිරිපත් කරනු ලැබීමට:

යෝජනාව:

පිඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පිඩාකාරී හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව
(මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව)

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 122 වන වගන්තිය යටතේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර, හා පිඩාකාරී අන්තරාදායක ව්‍යාපාර, පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාව, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, මිනිස් බල හා රැකිරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,

එම අනුමැතිය පිළිබඳ නිවේදනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/13 දරණ හා 2014.01.20 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරන්නට යෙදුන අතර,

එකී අතුරු ව්‍යවස්ථාවන්ට, අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම, එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරණ පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 125වන වගන්තිය යටතේ, මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට 2014-08-19 දින ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, තවදුරටත් 2015-03-03 දින පැවති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී සාකච්ඡාකර, තම නිර්දේශයන් සහිත වාර්තාව, 2015-03-17 දින මෙම පළාත් සභාවට ඉදිරිපත් කර ඇති හෙයින් එම කාරක සභා නිර්දේශයන් පිළිබඳවද සැළකිලිමත්ව ක්‍රියාකළ යුතුය '

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

### 01. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා:

"බස්නාහිර පළාත තුළ මේ වන විට පාසැල් දරුවන්ගෙන් දෙමාපියන්ගෙන් විටින්විට මුදල් අයකිරීම් සිදුවේ. පළමුවන ශ්‍රේණිය, හයවන ශ්‍රේණිය සහ දොළොස්වන ශ්‍රේණිය සඳහා දරුවන් ඇතුලත්කර ගැනීමේදී මෙන්ම වෙනත් පන්තිවල අවශ්‍යතා සඳහාද දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මෙලෙස මුදල් එකතුකිරීම නිසා ඔවුන් දැඩි දුෂ්කරතාවයකට පත්වී ඇත. එබැවින් බස්නාහිර පළාත තුල දරුවන්ගේ දෙමවුපියන්ගෙන් මුදල් එකතුකිරීම (පහසුකම් ගාස්තු හැර) නතර කළ යුතුයැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි"

(යෝ/VI (1) /14/09)

### 02. ගරු ලක්ෂමන් නිපුණ ආරච්චි මන්ත්‍රිතුමා:

" බස්නාහිර පළාත් පාසැල් සඳහා 1 වන ශ්‍රේණියට ළමුන් ඇතුලත්කර ගැනිමේදි දරුවන් හා දෙමවුපියන් පීඩාවට පත්කරන වර්තමාන ක්‍රමවේදය වෙනස්කිරීමේ අවශ්‍යතාවය මතුව ඇත. ඒ සඳහා දරුවන් පාසලට ඇතුලත්කර ගන්නා දින සිට මාසයක් ඉක්ම යාමට පෙර සියලූ පුරප්පාඩු පුරවා අවසන් කිරීමත්, ආරක්‍ෂක අංශවල සේවයේ නියුක්ත වූවන්ගේ දරුවන්ගේ නාම ලේඛනය දරුවන් ඇතුලත් කර ගත් දිනයේ සිට සති 3 ක් ඉක්ම යාමට පෙර පළාත් සභාවට ලැබිමට සැලැස්වීමත්, පාලක පක්‍ෂ මන්ත්‍රිවරුන් විසින් ඉදිරිපත් කරන නාම ලේඛණයට අනුව ළමුන් ඇතුලත් කර ගන්නා ක්‍රමය අහෝසි කිරිමත්, සම්මුඛ පරීක්‍ෂණ වලට සහභාගි වන සැම දරුවෙකුටම ලැබෙන ලකුණු අනුව ස්ථිර ලේඛනයක් ලකුණු අනුපිළිවෙලට අනුව සකස් කිරීමත් ලබා ගන්නා ලකුණු අනුපිළිවෙලට අනුව පාසලට දරුවන් ඇතුලත් කිරීමට පියවර ගැනිමත් කළ යුතුයැයි ද, ඒ අනුව බස්නාහිර පළාතේ පාසැල්වල පළමුවන ශ්‍රේණියට ළමුන් ඇතුලත් කිරීමේ කටයුතු විධිමත් කර පාසලකට දරුවෙකු ඇතුලත් කිරීමට තිබෙන මානව අයිතිය පළාතේ ජනතාවට තහවුරු කළ යුතු යැයි ද මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි. "

(යෝ /VI (1) /14/10)

## XI. සභාව කල් තැබීම

කේ.එම්.ඩී. කේ. සමරකෝන්
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2015.03.18 දින,
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.